මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - 2024

මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා අන්තර්ජාතික සංවර්ධන සංගමය අතර 2021 අප්‍රේල් 22 දින එළඹි අංක 6623-එල්කේ (සහනදායී ණය) සහ අංක 6624-එල්කේ (සහනදායී නොවන ණය) එස්එෆ් දරන ණය ගිවිසුම්වල IV වාවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කෙසේ වුවද, 2021 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ වගකීම අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත පවරා තිබුණු අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය බවට පත් විය. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයේ පොදු ප්‍රවාහන භාවිතා කරන්නන් සඳහා ප්‍රවේශ්‍යතාව, කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සංවර්ධනය කිරීම, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය අවට නගර ඒකාබද්ධ කිරීම සහ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම, ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා ගොඩනැගීම සහ හදිසි ප්‍රතිචාර සංරචකය යන සංරචක 04 යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 69.33 කට සමාන වූ රු.මිලියන 13,762 ක් වන අතර ඉන් වි.ගැ.හි. මිලියන 47.13 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 64.33 ක් සහනදායී කොන්දේසි යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කරනු ලබන අතර එ.ජ.ඩො. මිලියන 5 ක් සහනදායී නොවන කොන්දේසි යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කරනු ලැබේ. ව්‍යාපෘතියේ කටයුතු 2021 මැයි 06 දින ආරම්භ කරන ලද අතර, 2025 මැයි 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2027 මැයි 31 දක්වා දීර්ඝ කරන ලදී.

1.3 තත්ත්වාගනනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 කොටසේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

	ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණය	වටිනාකම රු.මිලියන	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	එකතුව රු. මිලියන 4,162.56 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වලින්, කොන්ත්‍රාත්කරුවන්ට සහ උපදේශකයින්ට ගෙවා ඇති රු. මිලියන 2,175.62 ක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස සටහන් කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ සටහන් කර ඇත. එබැවින්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි	2,175.62	එකඟ වෙමි. 2025 මූල්‍ය වර්ෂයේ සිට නිවැරදි කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී.	මූල්‍ය ප්‍රකාශනවලට අත්සන් තැබීමට පෙර, ගණකාධිකාරී විසින් එම මූල්‍ය ප්‍රකාශන තෝරාගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල වන බව සහතික කළ යුතුය.
(ආ)	මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුවට අදාළව රු. මිලියන 190.62 ක් වූ රඳවා ගැනීමේ මුදල කෙරීගෙන යන වැඩ සහ ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති කෙරීගෙන යන වැඩ සහ රඳවා ගැනීමේ මුදල් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි .	190.62	එකඟ වෙමි. 2025 මූල්‍ය වර්ෂයේ සිට නිවැරදි කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී.	මූල්‍ය ප්‍රකාශනවලට අත්සන් තැබීමට පෙර, ගණකාධිකාරී විසින් එම මූල්‍ය ප්‍රකාශන තෝරාගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල වන බව සහතික කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 88 සහ 89 ට අනුව, මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීමට අවම වශයෙන් ශීර්ෂ සහ උප එකතුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි දැක්වීම අදාළ වන විට, එලෙස ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, ඊට පටහැනිව, එකතුව රු. මිලියන 5,104.39 ක කෙරීගෙන යන වැඩ සංරචක අනුව වර්ගීකරණයක් ලෙස හෙළිදරව් කිරීම වෙනුවට, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතේ සඳහන් කර තිබුණි.	5,104.39	එකඟ වෙමි. 2025 මූල්‍ය වර්ෂයේ සිට නිවැරදි කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී.	මූල්‍ය ප්‍රකාශනවලට අත්සන් තැබීමට පෙර, ගණකාධිකාරී විසින් එම මූල්‍ය ප්‍රකාශන තෝරාගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල වන බව සහතික කළ යුතුය.
(ඈ)	උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (SCDP) මගින් මහනුවර	889.34	එකඟ නොවෙමි.	මූල්‍ය ප්‍රකාශනවලට අත්සන් තැබීමට පෙර,

	බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2022 වසර දක්වා රු.මිලියන 889.34 ක මුදලක් ගෙවා තිබුණද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් පෙර ව්‍යාපෘතියෙන් ඉහත ගෙවීම්වලට අදාළ තොරතුරු ලබාගෙන මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.		උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (SCDP) මගින් සිදු කරන ලද මෙම ව්‍යාපෘතියට අදාළ ගනුදෙනු පිළිබඳ කිසිදු විස්තරයක් මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය වෙත මෙතෙක් ලැබී නොමැති අතර, එබැවින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ නොහැකිය.	ගණකාධිකාරී විසින් එම මූල්‍ය ප්‍රකාශන තෝරාගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල වන බව සහතික කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 හි 39 වන ඡේදයට අනුව, විදේශ විනිමය හුවමාරු අනුපාතවල වෙනස්වීම්වලින් පැන නගින උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ මුදල් ප්‍රවාහ නොවේ. කෙසේ වුවද, රු.මිලියන 6.67 ක් වූ විදේශ විනිමය ලාභය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ප්‍රමිතිය අනුව ගළපා නොතිබුණි.	6.67	එකඟ නොවෙමි. මෙම විනිමය ලාභය මූල්‍ය කටයුතුවලින් ජනිත වීම හේතුවෙන්, එය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ සටහන් කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 හි 43(අ) ඡේදයට අනුව, වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පවතින අවසාන විදේශ විනිමය හුවමාරු අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ විදේශ ණයට අදාළ වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 1.13 කට සමාන රු. මිලියන 421.67 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල සහ රු. මිලියන 180.53 ක් වූ සාමාන්‍ය ගැළපුම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර හෝ හෙළිදරව් කර හෝ නොතිබුණි.	602.2	එකඟ නොවෙමි. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 පෙබරවාරි 22 දිනැති අංක SA/FR8Policy/Asset/ දරන ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් අනුව, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල සාමාන්‍ය විචලනය ගැළපීම අවශ්‍ය නොවේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(උ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 100 වන ඡේදයට අනුව, වාර්තාකරණ දිනයේදී ප්‍රායෝගිකව හැකි සෑම අවස්ථාවකම අසම්භාව්‍ය වගකීම් ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් ද සහිතව, අසම්භාව්‍ය වගකීම්වල එක් එක් පන්තින් පිළිබඳව හෙළිදරව් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත්කරු විසින්	3.24	එකඟ වෙමි. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අවසන් කරන අවස්ථාවේ කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරුවරයා විසින් මෙය සහතික කර නොමැත. මෙම හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන සටහන්වල ඉදිරිපත් කිරීම	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

	ඉදිරිපත් කරන ලද රු. මිලියන 3.24 ක් වූ විචලන නියෝග හයක් (06) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.		වැරදීමකින් මඟ හැරී ඇත.	
(ඌ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුට සහ උපදේශකයාට ගෙවිය යුතු ශේෂ රු. මිලියන 744.21 ක් විය. කෙසේ වුවද, හිඟ අතුරු ගෙවීම් සහතිකවලට (IPC) අනුව, එය රු. මිලියන 732.61 ක් විය. එබැවින්, ශේෂ දෙකක් අතර රු. මිලියන 11.6 ක වෙනසක් නිරීක්ෂණය විය.	11.6	වැඩිපුර තක්සේරු කිරීම හෝ අඩුවෙන් තක්සේරු කිරීම ඊළඟ වසරේ මූල්‍ය ප්‍රකාශනයට ගළපනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන අත්සන් තැබීමට පෙර, අනෙක් පාර්ශවයේ ලෙජර ශේෂ සමඟ ශේෂ සැසඳෙන බව ගණකාධිකාරී විසින් සහතික කළ යුතුය.
(එ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව, කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 5,104.39 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 05 ට අනුව එය රු. මිලියන 5,272.62 ක් විය. එබැවින්, ශේෂ දෙක අතර රු. මිලියන 168.23 ක වෙනසක් නිරීක්ෂණය විය.	168.23	එකඟ වෙමි. අනාගත මූල්‍ය ප්‍රකාශනවල එවැනි දෝෂ සිදු වීම වළක්වා ගැනීමට පියවර ගනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන අත්සන් තැබීමට පෙර, සියලුම ශේෂ අදාළ උපලේඛනය සමඟ සැසඳෙන බව ගණකාධිකාරී විසින් සහතික කළ යුතුය.

2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

	නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම /විගණන ගැටළුව	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව	රාජ්‍ය ආයතනවල සියලුම රාජ්‍ය සේවකයින්ගේ පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් තහවුරු කළ යුතුය. තවද, අතිකාල සහ නිවාඩු දින වැටුප් වැනි සාමාන්‍ය රාජකාරි වේලාවන්ගෙන් පරිබාහිරව සිදු කරන දීමනා ගෙවීම සඳහා පදනමක් ලෙස පැමිණීමේ සහ පිටවීමේ වේලාව භාවිතා කරන්නේ නම්, ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීමේ සහ පිටවීමේ වේලාව තහවුරු කළ යුතුය. කෙසේ වුවද, ඉහත චක්‍රලේඛයට පටහැනිව,	එකඟ වෙමි. ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි කිරීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වුවද, අතිකාල සහ නිවාඩු දින ගෙවීම් සිදු කරනු ලබන්නේ පැමිණීමේ ලේඛනය, බැහැර යෑමේ ලේඛනය සහ ධාවන සටහන් සමඟ පරීක්ෂා කිරීමෙන් පසුවය.	ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවි කිරීමට වහාම පියවර ගත යුතු අතර අතිකාල සහ අනෙකුත් දීමනා අනුමත කර සහතික කිරීමට පෙර ඒවා චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල බව තහවුරු කළ යුතුය.

		ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීමේ සහ පිටවීමේ වේලාවන් තහවුරු කර ගැනීමෙන් තොරව, අතිකාල දීමනා ලෙස රු. මිලියන 3.2 ක මුදලක් ගෙවා තිබුණි.		
(ආ)	2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයෙහි 9.3 උප වගන්තියට අනුව,	රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතු බව සහතික කළ යුතු අතර, එමගින් ව්‍යාපෘතිය පිළිබඳ වරින් වර සමාලෝචනය කිරීම සහ පද්ධතියේ කාර්යක්ෂම තාවය අධීක්ෂණය කළ හැකිය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා ඇති අතර එමඟින්, ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අහිතකර බලපෑමක් සිදු විය හැකිය.	එකඟ වෙමි. 2024 දී පැවති මැතිවරණ සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ පරිපාලන ප්‍රමාදයන් හේතුවෙන්, විධිමත් රැස්වීම් කාලසටහනක් පවත්වා ගැනීමට නොහැකි විය. මේ වන විට මෙය නිවැරදි කර ඇත.	ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අදාළ චක්‍රලේඛයට අනුකූලව මෙහෙයුම් කමිටු පවත්වන බව සහතික කළ යුතුය.
(ඇ)	2018 ජූලි 16 දිනැති අංක 3/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි 4 වන වගන්තියට අනුව,	රජයේ නියෝජිතායතනය මගින් වාහන කුලියට ගැනීමේදී මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගෙන මෙහෙයුම් කල්බදු ක්‍රමය (භාවිත කිරීම සහ ආපසු ලබා දීම) යටතේ වාහන 03 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් ලබාගෙන ඇති අතර 2024 වර්ෂයේ මාස 3 ක කාලයක් සඳහා රු. මිලියන 2.42 ක මුදලක් ගෙවා තිබුණි.	එකඟ වෙමි. 2018 ජූලි 16 දිනැති අංක 3/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය විශේෂ ව්‍යාපෘති සඳහා අදාළ නොවේ. කෙසේ වුවද, 2024 දෙවන කාර්තුවේ සිට ව්‍යාපෘතිය සඳහා වාහන කුලියට ගෙන නොතිබුණි.	ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස් උල්ලංඝනය කරන ලද, වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය.

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

	ක්‍රියාකාරකම	2024 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය %	2024 දෙසැම්බර් 31 දිනට අත්පත් කර ගත් කාර්ය සාධනය %	ප්‍රමාදය / විගණන ගැටළුව	ප්‍රමාදයට හේතුව	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	විගණක ගේ නිර්දේශය
(අ)	මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයෙහි (KMTT)ව්‍යුහාත්මක සහ වාස්තු විද්‍යාත්මක සංරචක සඳහා මූලික සහ සවිස්තරාත්මක සැලසුම	100	77	අනුමත වැඩ සටහනට අනුව, ව්‍යුහාත්මක සහ වාස්තු විද්‍යාත්මක සංරචක සඳහා මූලික සහ සවිස්තරාත්මක සැලසුම 2025 ජනවාරි 20 වන දිනට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, 2025 ජුනි 06 දින වන විටත් සවිස්තරාත්මක සැලසුම සම්පූර්ණ කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසියට අනුව, කාලය දීර්ඝ කිරීම සහ පිරිවැය ඉක්මවා යෑම අවම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	සවිස්තරාත්මක සැලසුම සඳහා අනපේක්ෂිත විමර්ශනයන් හේතුවෙන් සැලසුම් කිරීම ප්‍රමාදය වී ඇත.	එකඟ නොවෙමි. සවිස්තරාත්මක සැලසුම සඳහා අනපේක්ෂිත විමර්ශනයන් සිදු කිරීම හේතුවෙන් සැලසුම් කිරීමේ ප්‍රමාදය සිදුවී ඇත. කොන්ත්‍රාත්තුවට අනුව, ප්‍රමාදවීම අවම කිරීම සඳහා උපදේශකයා විසින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් සතිපතා මෙම ක්‍රියාවලිය සමීපව නිරීක්ෂණය කරයි.	එකඟ වූ කාල සීමාව තුළ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලෙස ප්‍රධාන ගණන්දී මේ නිලධාරි විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත උපදෙස් ලබා දිය යුතුය.

(ආ)	මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත (KMTT) ගොඩනැගිල්ලේ කුලුනු ඉදි කිරීම	100	62	පර්යන්ත ගොඩනැගිල්ලේ කුලුනු ඉදිකිරීම 2025 ජුනි 01 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, 2025 ජුනි 06 වන දින ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී මෙම කටයුතුවල සත්‍ය ප්‍රගතිය සියයට 62 ක් විය. කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසිවලට අනුව, කාලය දීර්ඝ කිරීම සහ පිරිවැය ඉක්මවා යෑම අවම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් අවශ්‍ය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	වැඩ බිම තුළ පැවති අනපේක්ෂිත තත්ත්වයන් /පාංශු තත්ත්වයන් හේතුවෙන්, කුලුනු ඉදිකිරීම සඳහා අපේක්ෂා කළ කාලයට වඩා වැඩි කාලයක් ගත කර ඇත.	එකඟ නොවෙමි. වැඩ බිම තුළ පැවති අනපේක්ෂිත තත්ත්වයන් /පාංශු තත්ත්වයන් හේතුවෙන් කුලුනු ඉදිකිරීම සඳහා අපේක්ෂා කළ කාලයට වඩා වැඩි කාලයක් ගත කර ඇත.	නියමිත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ආකේඩ් ගොඩනැගිල්ලේ අත්තිවාරම් කටයුතු.	100	0	අනුමත වැඩ සටහනට අනුව, ආකේඩ් ගොඩනැගිල්ලේ අත්තිවාරම් කටයුතු 2024 ඔක්තෝබර් 31 දින ආරම්භ කර 2025 පෙබරවාරි 24 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, අත්තිවාරම් කටයුතු 2025 ජුනි 06 වන දින දක්වාත් අවසන් කර නොමැති බවත්, කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසි වලට අනුව, කාලය දීර්ඝ කිරීම සහ පිරිවැය ඉක්මවා යෑම අවම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් අවශ්‍ය පියවර ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (SLR) සහ ප්‍රවාහන, මහා මාර්ග වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MOTH) අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමට අනුව, ඉඩම භාර දීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව(SLR) විසින් පියවර ගෙන නොතිබුණි.	එකඟ නොවෙමි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (SLR) සහ ප්‍රවාහන, මහා මාර්ග වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MOTH) අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමට අනුව, ඉඩම භාර දීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (SLR) විසින් පියවර ගෙන නොමැත.	නියමිත කාලය තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන ගැටළුව	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	කොන්ත්‍රාත්තු කොන්දේසි අංක 14.6.2 විධිවිධානයට අනුව, කොන්ත්‍රාතුවේ වැඩ අවසන් වන තෙක් ඉල්ලුම් කරන ලද බිල්පත් මුදල පිළිගත් කොන්ත්‍රාත් මුදලින් සියයට 2 ක් (තාවකාලික මුදල අඩු කළ) වූ විට, කොන්ත්‍රාත්කරු විසින් අතුරු ගෙවීම් අයදුම්පත් (IPA) ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව, ණය ගිවිසුමේ 3.01 නියමයේ III වගන්තියට අනුව, නොගෙවූ ශේෂයන් සඳහා බැදීම් ගාස්තු වැනි අනවශ්‍ය මූල්‍ය ගාස්තු ගෙවීම වළක්වා ගැනීම සඳහා කාර්යක්ෂමව අරමුදල් භාවිත කිරීම අත්‍යාවශ්‍ය වේ. කෙසේ වුවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 14.3 සහ 14.6.2 වගන්තිවල සඳහන් කොන්දේසිය අනුගමනය නොකර අතුරු ගෙවීම් අයදුම්පත් (IPA) 12 ක් ව්‍යාපෘතිය මගින් පිළිගෙන ඇති අතර වියදම් නොකළ ශේෂය සහ බැදීම් ගාස්තු වැඩි කිරීම සහ දායක අරමුදල් මන්දගාමීව භාවිතා කිරීමට බලපානු ඇත.	එකඟ නොවෙමි. ලංසුවෙන් සමහර අයිතම මඟ හැරී ඇති අතර වැඩබිමෙ තත්ත්වයන් අනුව, 'මැද ඇලෙහි' අනපේක්ෂිත වෙනස්කම් සැලසුමට ඇතුළත් කළ යුතුය. එබැවින්, කොන්ත්‍රාත්කරු ආරම්භයේදීම මෙම අයිතම සඳහා පිරිවැයක් දක්වා නොමැති බැවින් ඒවායේ මූල්‍ය අගයන් සිදු කරන ලද සත්‍ය කාර්යයන් පිළිබිඹු නොකරයි. ලෝක බැංකුව විසින් නිකුත් කරන ලද සේවාදායක සම්බන්ධතා ප්‍රකාශනවල කිසිදු බැදීම් ගාස්තුවක් මේ දක්වා සඳහන් කර නොමැත.	මුදල් ගෙවීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.
(ආ)	ණය ගිවිසුමේ අංක 02 උපලේඛනයේ "ඇ" වගන්තියට අනුව, ණය ක්‍රියාත්මක වීමේ දිනට පෙර හෝ ඉන් මාස 6ක් ඇතුළත ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත පිළියෙළ කර අවසන් කළ යුතුය. කෙසේ වුවද, ණය ක්‍රියාත්මක වන දින සිට වසර 4ක් ගතවී ඇතත්, මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතක් (PAM) පිළියෙළ කර නොතිබුණි. එබැවින්, සමෝධානික යොමු ලේඛනයක් නොමැති වීම, තීරණාත්මක පරිපාලන ක්‍රියා පටිපාටි සටහන් කිරීම, වාර්තාකරණ ආකෘති, අවදානම් කළමනාකරණ රාමු සහ වගවීමේ ව්‍යුහයන් ව්‍යාපෘති සම්බන්ධීකරණයට, තීරණ ගැනීම ප්‍රමාද කිරීමට සහ පරිත්‍යාගශීලීන්ගේ සහ රජයේ ක්‍රියා පටිපාටිවලට අනුකූල නොවීමේ අවදානම වැඩි කිරීමට අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.	එකඟ නොවෙමි. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය හා සම්බන්ධ හිමිකාරිත්ව ගැටළු හේතුවෙන්, මෙය මාස කිහිපයක් ප්‍රමාද වී ඇත. වර්තමානයේ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් මෙහෙයුම් අත්පොත ලෝක බැංකුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලෝක බැංකුවට යවා ඇති අතර මෙම ව්‍යාපෘතියට අදාළ ලෝක බැංකු ප්‍රසම්පාදන විශේෂඥයාගේ වාචික එකඟතාවය ලැබී ඇත.	ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත පිළියෙළ කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත උපදෙස් ලබා දිය යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 02 දින සිට 13 දක්වා කාලය තුළ, ලෝක බැංකුව විසින් සිදු කරන ලද දූත මණ්ඩල මෙහෙවරට අනුව, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයෙහි (KMTT) හිමිකාරිත්වය සහ මෙහෙයුම් ආකෘතිය හඳුනා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් ආරම්භ කරන ලෙස රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා තිබුණි. කෙසේ වුවද,	එකඟ නොවෙමි. පාර්ශවකරුවන්ගේ සහ මහා භාණ්ඩාගාරයේ සහයෝගීතාවයෙන් මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සඳහා හිමිකාරිත්ව ආකෘතිය සහ මෙහෙයුම් ආකෘතිය අවසන් කිරීමේ ක්‍රියාවලියක අමාත්‍යාංශය	මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය හි හිමිකාරිත්වය සහ මෙහෙයුම් ආකෘතිය අවසන් කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

	රේඛීය අමාත්‍ය ලේකම් එම ඉල්ලීමට අනුව කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතියේ සංරචක තුන යටතේ දක්වා ඇති "ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා සංවර්ධනය" සඳහා වෙන් කරන ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 4 ක්‍රියාවට නැංවීම සහ භාවිතය කෙරෙහි මෙම ප්‍රමාදය බලපානු ඇත.	නිරතව සිටී. කෙසේ වුවද, එම කොන්ත්‍රාත්තු ලබා දීමට අරමුදල් හිඟයක් පැවතීම හේතුවෙන් වෙන් කරන ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 04 දැනටමත් මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සිවිල් වැඩ සහ බස් මෙහෙයුම් කොන්ත්‍රාත්තු සඳහා මාරු කර ඇත.	
(ඇ)	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ලද හෙක්ටයාර 1.9216 ක ඉඩමක් මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා පවරා දී ඇති අතර අත්පත් කර ගත් භූමි ප්‍රදේශයේ ගොඩනැගිල්ල කඩා දැමීම වෙනුවෙන් දේශීය අරමුදල් (GOSL) යටතේ මහල් හතක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ව්‍යාපෘතිය මගින් එකඟ වී ඇත. 2024 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව, සත් මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2024 ජූලි 05 දින ප්‍රදානය කිරීමට නියමිතව තිබුණි. එසේ වුවද, වසරක කාලයක් ගතවී ඇතත්, 2025 මැයි මස අවසානය වන තෙක්ම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි.	එකඟ වෙමි. 2024 වර්ෂය වන තෙක්, අරමුදල් මූලාශ්‍රය ලෝක බැංකුව ද, නැතහොත් ශ්‍රී ලංකා රජය (GOSL) ද යන්න තීරණය කර නොතිබුණි. එබැවින්, 2024 දක්වා ප්‍රමාදයක් ඇති වූ අතර, මේ වන විට දේශීය අරමුදල් (GOSL) මේ සඳහා වෙන් කර ඇති බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසාන අදියරේ පවතී.	ණය කාලසීමාව තුළ වැඩ අවසන් කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම, කාල ඉලක්කය ඇතුළුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර ලබා ගැනීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අවශ්‍ය පියවර ගත යුතුය.
(ඉ)	කෙසේ වුවද, ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීමක් මත පදනම්ව, අනෙකුත් ණය නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමකින් තොරව ලෝක බැංකුව විසින් ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාලය 2025 මැයි 31 සිට 2027 මැයි 30 දක්වා දීර්ඝ කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2025 වර්ෂයේ සිට ණය ආපසු ගෙවීම ආරම්භ කළ යුතු අතර එම ණය මුදල 2045 වර්ෂය දක්වා ගෙවිය යුතුය. ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් ලබා නොගෙන රජයට ණය වාරිකය ගෙවීමට සිදු වූ බව නිරීක්ෂණය විය. ඉහත අවාසියේ බලපෑම රජය වෙත සන්නිවේදනය කිරීමට සහ එය අවම කිරීම සඳහා පියවර ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) කටයුතු කර නොතිබුණි.	එකඟ නොවෙමි. 2019 වර්ෂයේ දී උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (SCDP) යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් වෙන් කරන ලදී. රට තුළ පැවති කොවිඩ් 19 වසංගතය සහ මූල්‍ය අර්බුදය හේතුවෙන්, මෙය 2022 දක්වා ප්‍රමාද වී ඇත. ව්‍යාපෘතිය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙන් මහාමාර්ග අමාත්‍යාංශයට පැවරීමට රජය තීරණය කර ඇත.	ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය.
(ඊ)	ලෝක බැංකු මෙහෙවර වාර්තාවට අනුව, රු.මිලියන 362 ක මුදලක් දෝෂ සඳහා වගකීම් කාලය තුළ වැය කිරීමට ඇස්තමේන්තු කර ඇති අතර මෙම වියදම ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතුය. 2021 සිට 2024 දක්වා මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, සමාලෝචිත වර්ෂය තුළ	එකඟ වෙමි. 2024 වර්ෂයේදී මෙය අමාත්‍ය මණ්ඩලයට දැනුම් දී ඇති අතර අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත.	ව්‍යාපෘතිය මගින් නිසි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර ඒ අනුව, අයවැය සහ වගකීම් නියම කළ යුතු වේ.

	සියයට 12.26 ක ශුද්ධ ප්‍රතිලාභ ලබා ගැනීම ඇතුළුව ව්‍යාපෘති පිරිවැයෙන් ශුද්ධ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් බලපෑමක් සිදු වූ අතර, එමෙන්ම, ව්‍යාපෘති පිරිවැය ඉක්මවා ගිය බවත්, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම ප්‍රමාද වූ බවත්, මෙම අතිරේක පිරිවැය ආවරණය කිරීම සඳහා විකල්ප මූල්‍යකරණ විධිවිධාන තක්සේරු කිරීම අවශ්‍ය වූ බවත් නිරීක්ෂණය විය.		
(උ)	කෙසේ වුවද, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද මහනුවර නගරය සඳහා උපායමාර්ගික රථවාහන කළමනාකරණ සහ රථවාහන සංසරණ සැලසුම් වාර්තාව (CBD) පැවතියද, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත පිවිසුමේදී යෝජිත දුම්රිය මාර්ගයේ කැණීම් හේතුවෙන් ඇති වන රථවාහන තදබදය මඟහරවා ගැනීම සඳහා, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සිට හෝ මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත දක්වා බස් රථ සඳහා පමණක් ඒවායේ ද්වි-මාර්ග ගමනාගමනය සඳහා මාර්ග යට පාලමක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී ඉහත අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබුණු අතර, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයට පිවිසීමේදී අපේක්ෂිත රථවාහන තදබදයට විසඳුමක් නොමැතිව ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. එබැවින්, මෙම තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති අරමුණු සැලසුම් කළ පරිදි සාක්ෂාත් කරගත නොහැකි වනු ඇත.	එකඟ නොවෙමි. නාගරික සංවර්ධන අධිකාරිය (UDA) යටතේ උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (SCDP) විසින් මූලික සංවර්ධන සැලැස්ම සකස් කර ඇති අතර මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කාර්යය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට(PMU) ලබා දී ඇත. මේ යටතේ, සේවා කේබල් සහ අපජල ඇළ මාර්ග බහුලව පැවතීම හේතුවෙන් යෝජිත යටි පාලමේ ඉදිකිරීම් කටයුතු සිදු කළ නොහැකි බව අනාවරණය විය.	මහනුවර සඳහා උපායමාර්ගික රථවාහන කළමනාකරණය සහ රථවාහන සංසරණ සැලැස්ම පිළිබඳ වාර්තාවේ රථවාහන තද බදය මඟ හරවා ගැනීම සඳහා යෝජනා කර ඇති සියලුම පිළියම් යෙදීම්වල පවතින බලපෑම් හඳුනා ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය පියවර ගත යුතුය.
(ඌ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.9.3 ඡේදයට අනුව, රු. මිලියන 500 ඉක්මවන ඕනෑම භාණ්ඩයක් හෝ සේවාවක් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අත්සන් කළ යුතුය. කෙසේ වුවද, රු. මිලියන 25,697.87 ක් වූ මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුම 2024 පෙබරවාරි 01 වන දින මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නිසි අවසරයකින් තොරව අත්සන් කර තිබුණි.	එකඟ නොවෙමි. ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ ප්‍රධානියා ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රධාන කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ඇත.	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමේ බලපෑම හඳුනා ගැනීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.